# පාර්ලිමේන්තු විත්ති

පුවත් හසුන

2 වන කාණ්ඩය

අගෝස්තු 2020


01 ජනාධිපතිතුමා නවවැනි පාර්ලිමේන්තුවේ පළමු සභාවාරය උත්සවාකාරයෙන් විවෘත කරයි

02 මහින්ද යාපා අබේවර්ධන මහතා අභිනව කථානායකවරයා ලෙස පත් වෙයි

03 රංජිත් සියඹලාපිටිය මහතා නියෝජ්‍ය කථානායක ධූරයට

නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා ලෙස අංගජන් රාමනාදන් මහතා පත් වෙයි

04 අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා සභානායක ධූරයට


ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා ලෙස අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා පත්වෙයි

ආණ්ඩු පක්ෂයේ නියෝජ්‍ය සංවිධායකවරු ලෙස ඩිලාන් පෙරේරා මහතා සහ ජයන්ත කැටගොඩ මහතා පත්වෙති

05 අලුත් පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරියන් දොළහක්

09 ශ්‍රී ලංකාවේ වේත්‍රධාරී ධූරය එහි ඉතිහාසය සහ මෙහෙවර

12 මහජන ඡන්දයෙන් නවවන පාර්ලිමේන්තුව තරුණ වෙයි


සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

# ජනාධිපතිතුමා නවවැනි පාර්ලිමේන්තුවේ පළමු සභාවාරය උත්සවාකාරයෙන් විවෘත කරයි



**අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා පසුගිය 20 වැනිදා පස්වරුවේ නවවැනි පාර්ලිමේන්තුවේ පළමු සභාවාරය උත්සවාකාරයෙන් විවෘත කළේය.**

මහ මැතිවරණයෙන් පසු ප්‍රථම වරට පාර්ලිමේන්තුවට පැමිණි අතිගරු ජනාධිපතිතුමා පළමු සභාවාරය විවෘත කිරීමෙන් පසු ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය ද ඉදිරිපත් කළේය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33(2) ව්‍යවස්ථාව ප්‍රකාරව එතුමාට ඒ සඳහා බලය හිමි වේ. සභාවාරය විවෘත කිරීමේ උත්සවයට පළමුවෙන් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සම්ප්‍රාප්තිය  සිදු වූ අතර, ගරු කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතාගේ පැමිණීමෙන් පසු,  ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආගමනය සිදු විය. අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සහ එම මැතිනියගේ සම්ප්‍රාප්තිය සිදු වූයේ ඉන් අනතුරුවය.

එහි දී ගරු කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා සහ පාර්ලිමේන්තු මහ ලේකම් ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තු ගොඩනැඟිල්ලේ ප්‍රධාන පියගැට පෙළ අසල දී, අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා පිළිගැනීමට කටයුතු කළේය.

වේත්‍රධාරී, නියෝජ්‍ය වේත්‍රධාරී සහ සහකාර වේත්‍රධාරී පෙරටු කරගත් ගරු කථානායකතුමා සහ පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමා විසින් අතිගරු ජනාධිපතිතුමා පාර්ලිමේන්තු මන්දිරය වෙත කැඳවා ගෙන ගිය අතර, එම අවස්ථාවේ දී පාර්ලිමේන්තුවේ ප්‍රධාන ද්වාරය අසල දී කොළඹ දේවී බාලිකා විද්‍යාලයේ සිසුවියෝ ජයමංගල ගාථා ගායනා කර අතිගරු ජනාධිපතිතුමාට ආශිර්වාද කළෝය.

ප.ව. 03.00 ට අතිගරු ජනාධිපතිතුමා සභාගර්භයට පිවිසි අතර, ඉන්පසු මූලාසනයේ අසුන් ගනිමින් සභාවාරය විවෘත කළේය. ජනාධිපතිතුමා ඉන් අනතුරුව ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කළේය.

අතිගරු ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට පැමිණීමේ උත්සවය ඉතා චාම්ව පැවැත්වීමට එතුමාගේ උපදෙස් මත, කටයුතු යොදා තිබූ අතර, ඒ අනුව ආචාර වෙඩි මුර සහ රථ පෙළපාලි නොපැවැත්විණ. ඒ වෙනුවට එතුමා පිළිගැනීම සඳහා පාර්ලිමේන්තුව ඉදිරිපිට දී ත්‍රිවිධ හමුදාවේ දායකත්වයෙන් සංස්කෘතික අංග කිහිපයකින් සමන්විත ආචාර දැක්වීමක් සිදු කෙරිණි.

**කතුවැකිය**

# පාර්ලිමේන්තුවේ ගෞරවය සුරැකීම

ආසියාවේ පැරණිම පාර්ලිමේන්තු සම්ප්‍රදායන් පවතින රටවල් අතර ශ්‍රී ලංකාවත්, ඉන්දියාවත් ඉදිරියෙන්ම සිටී. එමෙන්ම ලොව ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක රටවල් අතරද ශ්‍රී ලංකාවට හිමි වන්නේ ප්‍රමුඛ ස්ථානයකි. එහෙයින්ම, පසුගිය කාලයේදී පාර්ලිමේන්තුවේ ගෞරවය පිළිබඳව සංවාදයක් රට තුළ හට ගැනිණි. මහජනයාගේ විවේචනයක් ද පාර්ලිමේන්තුව වෙත එල්ල විය. ඒ කෙසේ වුවද දැන් අලුත් පාර්ලිමේන්තුවක් මහජන ඡන්දයෙන් තේරී පත් පත්ව තිබේ.

පාර්ලිමේන්තුවේ ගෞරවය හා විශ්වාසය සුරකින හා සුරක්ෂිත වන අයුරින් කටයුතු කිරීමේ වගකීම හා අභියෝගය ඇත්තේ එහි මන්ත්‍රීවරුන්ටය. මේ අභියෝගය ජය ගැනීම අපහසු නැත. අලුත් මන්ත්‍රීවරු 81 දෙනෙකු පාර්ලිමේන්තුවට පත්ව සිටිති. ඔවුන් නිසැකවම නව ජවයකින් පාර්ලිමේන්තුව තුළ කටයුතු කරනු ඇත. එමෙන්ම සාමූහිකත්වය හැමවිටම වැදගත් වෙයි. පාර්ලිමේන්තුවේ අසුන් ගන්නා 225ක් වන මහජන නියෝජිතයන් රට ගොඩනැගීම යන කාරණයේදී සාමූහිකව ඔවුන් තම යුතුකම හා වගකීම ඉටු කරනු ඇතැයි අපේක්ෂා කරන්නෙමු. එමෙන්ම අලුත් පාර්ලිමේන්තුවේ සියලු මහජන නියෝජිතයන්ට අපගේ සුබපැතුම් එකතු කරන්නෙමු.

# මහින්ද යාපා අබේවර්ධන මහතා අභිනව කථානායකවරයා ලෙස පත් වෙයි



**පාර්ලිමේන්තුවේ අභිනව කථානායකවරයා ලෙස මහින්ද යාපා අබේවර්ධන මහතා පාර්ලිමේන්තුවේ මහ ලේකම් ධම්මික දසනායක මහතා ඉදිරියේ දිවුරුම් දුන්නේය.**

1945 වසරේ ඔක්තෝම්බර් මස 10 වැනි දින මාතර මාකඳුර ප්‍රදේශයේ දී උපත ලද මහින්ද යාපා අබේවර්ධන මහතා වසර 30 කට වඩා අත්දැකීම් ඇති පරිණත දේශපාලනඥයෙකි. තෙලිජ්ජවිල මධ්‍ය මහා විද්‍යාලයෙන් සහ මාතර රාහුල විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලැබූ මහින්ද යාපා අබේවර්ධන මහතා කොළඹ විශ්වවිද්‍යාලයෙන් සිය ප්‍රථම උපාධිය හිමිකරගෙන තිබේ. ඉන්දියාවේ චන්දිගාර් කළමනාකරණ ආයතනයේ කළමනාකරණය පිළිබඳ විශේෂ පුහුණුවක් ලබා ගැනීමට ද එතුමා සමත්ව තිබේ.

1983 වසරේදී හක්මන ආසනයේ පැවති අතුරු මැතිවරණයෙන් ජය ලබා එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් ප්‍රථම වරට පාර්ලිමේන්තුවට පිවිසෙන ඒ මහතා වසර 23 ක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස කටයුතු කර තිබේ. 2020 මහ මැතිවරණය සඳහා මාතර දිස්ත්‍රික්කයට ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙන් තරඟ කළ මහින්ද යාපා අබේවර්ධන මහතා මනාප ඡන්ද 80,895ක් ලබා ගනිමින් පාර්ලිමේන්තුවට පිවිසුණේය.

1993/94 කාල සීමාව තුළ දකුණු පළාත් සභාවේ සභාපති ලෙස කටයුතු කළ එතුමා 1994/2001 කාල සීමාව තුළ එම පළාත් සභාවේම ප්‍රධාන අමාත්‍යවරයා ලෙස ද කටයුතු කර තිබේ. ඉන් අනතුරුව පත්වූ විවිධ රජයන්හි සෞඛ්‍ය, සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන්, වාරිමාර්ග හා ග්‍රාම සංවර්ධන, කර්මාන්ත හා වාණිජ කටයුතු, පාර්ලිමේන්තු කටයුතු සහ කෘෂිකර්ම වැනි අමාත්‍ය ධූර රැසක් ද එතුමා හොබවා ඇත.



1987 වසරේදී කෝප් කමිටුවේ සාමාජිකයෙකු ලෙසද එතුමා කටයුතු කර තිබේ. 2002 වසරේ දී චීනයේ බීජිං නුවර පැවැති සාමය සඳහා ආසියානු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ හමුවට ද සහභාගී වී ඇති මහින්ද යාපා අබේවර්ධන මහතා, බංගලාදේශයේ ඩකා අගනුවර පැවැති 50 වන C.P.A සමුළුවට ද, 2005 වසරේ ෆීජි නුවර පැවැති අන්තර්ජාතික පාර්ලිමේන්තු සම්මන්ත්‍රණයට ද සහභාගී වී තිබේ.

# රංජිත් සියඹලාපිටිය මහතා නියෝජ්‍ය කථානායක ධූරයට



පාර්ලිමේන්තුවේ නව නියෝජ්‍ය කථානායකවරයා ලෙස රංජිත් සියඹලාපිටිය මහතා තේරී පත් විය.

සියඹලාපිටිය මහතා නියෝජ්‍ය කථානායක ධූරයට සුදුසු බවට පරිසර අමාත්‍ය මහින්ද අමරවීර මහතා යෝජනා කළ අතර, ග්‍රාමීය මාර්ග සහ අවශේෂ යටිතල පහසුකම් පිළිබඳ රාජ්‍ය අමාත්‍ය නිමල් ලන්සා මහතා එය ස්ථිර කළේය.

රංජිත් සියඹලාපිටිය මහතා පසුගිය මහ මැතිවරණයේ දී කෑගල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරමින් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙන් තරඟ කළ අතර, මනාප ඡන්ද 103,300ක් ලබා ගනිමින් පාර්ලිමේන්තුවට තේරී පත් විය.

වැන්ඳල ප්‍රාථමික විද්‍යාලයෙන් සහ වැන්ඳල කනිෂ්ඨ විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය හැදෑරූ රංජිත් සියඹලාපිටිය මහතා පහ වසර ශිෂ්‍යත්වයෙන් දිවයිනේ දෙවැනියා ලෙස සමත් වෙමින් කොළඹ රාජකීය විද්‍යාලයට ඇතුළත් විය. එහිදී ඇතුළත් වීමේ විභාගයට මුහුණ දෙන ඔහු සිසුන් තුන් දහසක් අතරින් දෙවැනියා බවට පත් විය. රාජකීය විද්‍යාලයේ එල්ලේ සහ වොලිබෝල් කණ්ඩායම ආරම්භ කිරීමට නායකත්වය දෙන්නේ ද ඔහුය.

උසස් පෙළ වාණිජ විෂය ධාරාවෙන් හදාරන ඔහු කොළඹ දිස්ත්‍රික්කයේ දෙවැනියා බවට පත්වෙමින් ජයවර්ධනපුර සරසවියට ඇතුළත් විය. එහිදී සරසවි වොලිබෝල් කණ්ඩායමට නායකත්වය දී එහි වර්ණලාභී ක්‍රීඩකයකු බවට පත්වේ. විශ්වවිද්‍යාලයේදී රාජ්‍ය පරිපාලනය පිළිබඳ උපාධිය දිනා ගත් හෙතෙම කෘෂිකර්මාන්තය ආශ්‍රිතව තම ව්‍යාපාර කටයුතු දියත් කරන්නේ ය.

රුවන්වැල්ල ආසනයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සංවිධායකවරයා ලෙස 1998 ජුලි 30 දින පත්වීම භාරගන්නා ඔහු 1999 පැවැති පළාත් සභා මැතිවරණයට ඉදිරිපත් වී, මනාප ඡන්ද 21635 ලබා පළාත් සභාවට තේරී පත් විය. 2000 මහමැතිවරණයේදී කෑගල්ල දිස්ත්‍රික්කයට පොදු ජන එක්සත් පෙරමුණෙන් තරඟ වදින ඔහු මනාප ඡන්ද 49585ක් ලබා ප්‍රථම වරට පාර්ලිමේන්තුව නියෝජනය කිරීමේ අවස්ථාව උදා කර ගන්නේය.

2004 මැතිවරණයේ දී මනාප ඡන්ද අසූදහස් දෙසිය තිස් හයක් ලැබූ ඔහු පාර්ලිමේන්තුවට තේරී පත් විය. එම නියෝජනය සමඟ මුදල් ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍ය තනතුර හිමිවිය. 2005 දී මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා යටතේ මුදල් නියෝජ්‍ය අමාත්‍ය තනතුර හිමිවූ අතර 2007 දි මුදල් හා රාජ්‍ය ආදායම් අමාත්‍යවරයා ලෙස ද කටයුතු කර තිබේ. 2010 පාර්ලිමේන්තු මැතිවරණයේදී කෑගලු මැතිවරණ ඉතිහාසයේ වැඩිම වාර්තාගත මනාප ඡන්ද සංඛ්‍යාව රංජිත් සියඹලාපිටිය මහතා වන 146623 ක් ලබා පාර්ලිමේන්තුවට තේරී පත්විය. අනතුරුව ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය ධූරයත්, විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ කැබිනට් අමාත්‍ය ධූරයත් හිමිවිය. නැණසල ව්‍යාපෘතිය සඳහා 2018 ලොව හොඳම ග්‍රාමීය තොරතුරු තාක්ෂණ සම්මානය වන බිල් සහ මෙලින්ඩා ගේට්ස් සම්මානය රැගෙන ආවේ ඔහු විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යවරයා වශයෙන් කටයුතු කරන කාලසීමාවේදී ය.

2015 මැතිවරණයෙන් අනතුරුව සියඹලාපිටිය මහතා ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍ය සහ පරිසර රාජ්‍ය අමාත්‍ය සහ විදුලි හා පුනර්ජනනීය බලශක්ති කැබිනට් අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළේය. අනතුරුව ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ විජයග්‍රහණයෙන් අනතුරුව තේරී පත් වූ ආණ්ඩුවේ අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළේය. හෙතෙම කොස්ටරිකා ජාත්‍යන්තර විශ්ව විද්‍යාලයෙන් රාජ්‍ය පරිපාලනය පිළිබඳ ආචාර්ය උපාධිය හිමිකර ගෙන ඇත.

# නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා ලෙස අංගජන් රාමනාදන් මහතා පත් වෙයි



නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා ලෙස අංගජන් රාමනාදන් මහතා තේරී පත් විය.

ඒ මහතාගේ නම කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මහතා විසින් යෝජනා කරනු ලැබූ අතර, සූර්යබල, සුළං හා ජල, විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍ය දුමින්ද දිසානායක මහතා එම යෝජනාව ස්ථිර කළේය.


අංගජන් රාමනාදන් මහතා කොළඹ හින්දු විද්‍යාලයෙන්, කොළඹ ජාත්‍යන්තර පාසල (CIS) සහ ගල්කිස්ස ශාන්ත තෝමස් විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය හදාරා ඇත. ඔහු ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධිධාරියෙකි.

ඔහු 2013 වසරේ දී උතුරු පළාත් සභාවට තරඟ කළ අතර එහි දී ඡන්ද 10,034 ක් ලබා ගනිමින් පළාත් සභාවට තේරී පත් විය.

2015 මහ මැතිවරණයේදී ඔහු නිදහස් පක්ෂය වෙනුවෙන් ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තේරී පත් විය. 2015 පත් කරන ලද යාපනය, කිලිනොච්චි දිස්ත්‍රික් සංවර්ධන කමිටුවල සම්බන්ධීකරණ සම සභාපති ලෙස කටයුතු කළේය.

2018 වසරේ දී කෘෂිකර්ම නියෝජ්‍ය අමාත්‍ය ධූරයට පත්වූ හෙතෙම පසුගිය මහමැතිවරණයේදී යාපනය දිස්ත්‍රික්කය නියෝජනය කරමින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් තරඟ කළ අතර, මනාප ඡන්ද 36,365 ලබා ගනිමින් පාර්ලිමේන්තුවට තේරී පත් විය.

# අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා සභානායක ධුරයට



විදේශ අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා නවවැනි පාර්ලිමේන්තුවේ මංගල සභා වාරයේ ප්‍රථම රැස්වීම ආරම්භ වීමට ප්‍රථමයෙන් පසුගිය 20 වැනිදා පෙ.ව. 8.46 ට යෙදුණු සුබ මොහොතින් නිල වශයෙන් සභානායක ධුරයෙහි සිය රාජකාරි ඇරඹීය.

මෙරට පාර්ලිමේන්තුවේ දහහත්වැනි සභානායකවරයා වන අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය විසින් උණුසුම් ලෙස පිළිගැනීමෙන් අනතුරුව, ආගමික වතාවත්හි නිරත වුණු අතර පසුව තම කාර්යාලයීය ලිපිවලට අත්සන් තබමින් සිය නිල කටයුතු ආරම්භ කළේය. අමාත්‍ය ගුණවර්ධන මහතා පසුගිය වසරේ ජනවාරි මස 03 වැනි දින සිට මාර්තු 02 දක්වාද සභානායක ලෙස කටයුතු කළ අතර, ඊට පෙර සයවැනි හා හත්වැනි පාර්ලිමේන්තුවලද ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ලෙස විශේෂ කාර්යභාරයක් ඉටු කර ඇත.

# ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා ලෙස අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා පත්වෙයි



මහාමාර්ග අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා ද නවවැනි පාර්ලිමේන්තුවේ මංගල සභා වාරයේ ප්‍රථම රැස්වීම ආරම්භ වීමට පෙර ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ධුරයේ නිල වශයෙන් සිය රාජකාරි ආරම්භ කළේය. එහි දී එතුමා පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය විසින් උණුසුම් ලෙස පිළිගැනීමෙන් අනතුරුව, සිය කාර්යාලයීය ලිපිවලට අත්සන් තබමින් නිල කටයුතු ආරම්භ කළේය.

අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා පසුගිය වසරේ ජනවාරි මස 03 වැනි දින සිට මාර්තු 02 දක්වා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා ලෙස කටයුතු කළේය.

# ආණ්ඩු පක්ෂයේ නියෝජ්‍ය සංවිධායකවරු ලෙස ඩිලාන් පෙරේරා මහතා සහ ජයන්ත කැටගොඩ මහතා පත්වෙති





පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ නියෝජ්‍ය සංවිධායකවරුන් ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන ඩිලාන් පෙරේරා මහතා සහ ජයන්ත කැටගොඩ මහතා පත් කර තිබේ.

මෙයට අමතරව ආණ්ඩු පක්ෂයේ සහකාර සංවිධායකවරුන් ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රී ජගත් පුෂ්පකුමාර මහතා සහ පාර්ලිමේන්තු මන්ත්‍රී මොහොමඩ් මුසාම්මිල් මහතා සහ ගරු අසංක නවරත්න මහතා පත් කර තිබේ. මෙම තනතුරු කැබිනට් මණ්ඩලය විසින් අනුමත කළ තනතුරු වේ.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන ඩිලාන් පෙරේරා සහ ජයන්ත කැටගොඩ මහත්වරුන් විසින් පසුගිය 21 වැනිදා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක මහාමාර්ග අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා ඉදිරියේ වැඩ භාර ගනු ලැබිණි.

අනතුරුව ජගත් පුෂ්පකුමාර, මොහොමඩ් මුසාම්මිල් සහ අසංක නවරත්න යන මහත්වරු සිය තනතුරුවල වැඩ කටයුතු භාර ගත්හ.

# අලුත් පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරියන් දොළහක්

**විශේෂාංග**



කාන්තා මන්ත්‍රීවරියන් දොළොස් දෙනෙක් 2020 අගෝස්තු 20 ඇරඹුණ නියමිත නවවැනි පාර්ලිමේන්තුව නියෝජනය කරති. එය ප්‍රතිශතාත්මකව ගත් කල 5.3% ක නියෝජනයක් වේ. මෙම කාන්තා මන්ත්‍රීවරියෝ වෘත්තීමය වශයෙන් විවිධ අංශ නියෝජනය කරති. එයින් වැඩිම වෘත්තිකයන් සංඛ්‍යාවක් නියෝජනය කරන්නේ නීතිඥ වෘත්තිය හා ගුරු වෘත්තියයි.

ඒ අනුව පාර්ලිමේන්තුවට තේරී පත්ව සිටින කාන්තා මන්ත්‍රීවරියන් අතර නීතිඥවරියන්ගේ හා ගුරුවරියන්ගේ ප්‍රතිශතය සමාන අගයක් ගන්නා අතර එය 25ක් වේ. තේරී පත්ව සිටින කාන්තා මන්ත්‍රීවරියන් දෙදෙනෙක්ම විශේෂඥ වෛද්‍යවරියන් වන අතර, එය ප්‍රතිශතාත්මකව 16% කි. ජාතික ලැයිස්තුවෙන් තේරී පත් වූ එක් කාන්තා මන්ත්‍රීවරියක් ආචාර්ය උපාධි හිමි ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරියක් වන අතර, කලා ක්ෂේත්‍රයේ නිරත ව්‍යවසායිකාවකද, ගුවන් සේවිකාවක හා සමාජ සේවිකාවකද මෙම කාන්තා මන්ත්‍රීවරියන් දොළොස්දෙනා අතරට එක්ව සිටිති.

මෙවර පාර්ලිමේන්තුවේ වැඩිම මන්ත්‍රීවරියන් සංඛ්‍යාවක් නියෝජනය කරන්නේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ වන අතර, එම මන්ත්‍රීධුර සංඛ්‍යාව 08 කි. එම මන්ත්‍රීවරියන් අතර පසුගිය පාර්ලිමේන්තුව නියෝජනය කළ මෙවරද අමාත්‍යධුරයන්හි දිවුරුම් දුන් සෞඛ්‍ය ඇමතිනී නීතිඥ පවිත්‍රාදේවී වන්නිආරච්චි (රත්නපුර), රාජ්‍ය අමාත්‍ය, විශේෂඥ වෛද්‍ය සුදර්ශනි ප්‍රනාන්දුපුල්ලේ (ගම්පහ) ද පාර්ලිමේන්තු මන්ත්‍රිනී ගීතා කුමාරසිංහ (ගාල්ල) ද වෙති.

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පාර්ලිමේන්තුවේදී නියෝජනය කිරීමට නවක කාන්තා මන්ත්‍රීවරියෝ තිදෙනෙක් ද මහජන ඡන්දයෙන් තේරී පත්ව සිටිති. ඔවුන් රාජිකා වික්‍රමසිංහ (කෑගල්ල), මුදිතා ද සොයිසා (රත්නපුර) සහ කෝකිලා හර්ෂණි ගුණවර්ධන (ගම්පහ) යන මන්ත්‍රීවරියන්ය. එමෙන්ම ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ජාතික ලැයිස්තුව නියෝජනය කරමින් විශේෂඥ වෛද්‍ය සීතා අරඹේපොළ සහ මංජුලා දිසානායක යන මන්ත්‍රීවරියෝ මෙවර පාර්ලිමේන්තුව නියෝජනය කරති.

දිගු කලක් පාර්ලිමේන්තුව නියෝජනය කළ නීතිඥ තලතා අතුකෝරළ (රත්නපුර) සහ පසුගිය පාර්ලිමේන්තුව නියෝජනය කළ රෝහිණී කුමාරි කවිරත්න (මාතලේ) මෙවර සමඟි ජන බලවේගය පක්ෂයෙන් පාර්ලිමේන්තුව නියෝජනය කරන මහජන ඡන්දයෙන් තේරී පත් වූ කාන්තා මන්ත්‍රීවරියෝ වෙති. එම පක්ෂයේ ජාතික ලැයිස්තුව නියෝජනය කරන්නේ ඩයනා ගමගේ නවක මන්ත්‍රීවරියයි.ජාතික ජන බලවේගය නියෝජනය කරමින් ආචාර්ය හරිනි අමරසූරිය මහත්මිය ද මෙවර ප්‍රථම වරට පාර්ලිමේන්තුව නියෝජනය කරන්නීය.

## නීතිඥ පවිත්‍රාදේවී වන්නිආරච්චි

හිටපු ජ්‍යෙෂ්ඨ දේශපාලඥයකු වූ ධර්මදාස වන්නිආරච්චි මහතාගේ දියණියක වන ඇමතිනී පවිත්‍රාදේවී වන්නිආරච්චි මහත්මිය හිටපු අගමැතිනි සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ඇරයුමට අනුව 1990 දී දේශපාලනයට ප්‍රවිෂ්ට වූවාය. ඉන්පසුව 1993 දී සබරගමුව පළාත් සභාව නියෝජනය කළ ඇය 1994 දී රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට පිවිසියාය. 2000 වසරේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නියෝජ්‍ය ලේකම් ධූරයට පත්වූ ඇය, 2008 වසරේදී පොදු රාජ්‍ය මණ්ඩලීය තරුණ සංසදයේ සභාපතිවරිය ලෙසද කටයුතු කොට ඇත.

2001 සිට 2004 කාලය දක්වාත් 2015 සිට 2019 දක්වා කාල සීමාව තුළත් විපක්ෂයේ ප්‍රබල සාමාජිකාවක ලෙස කටයුතු කළ ඇය 2019 වසරේදී කාන්තා හා ළමා කටයුතු, සමාජ ආරක්ෂණ, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යවරිය ලෙස කටයුතු කළ අතර, කොවිඩ් 19 වසංගතය පිටුදැකීම වෙනුවෙන් සුවිශේෂී කාර්යභාරයක් සිදු කරන ලදි.

## විශේෂඥ වෛද්‍ය සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ

1984 වසරේ කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයෙන් වෛද්‍ය උපාධිය ලබා ගන්නා ඇය 1993 දී ප්‍රජා සෞඛ්‍ය පිළිබඳ පශ්චාත් උපාධිය සමත්ව ඕස්ට්‍රේලියාවේ මෙල්බන් නුවර ලාට්‍රෝබ් විශ්වවිද්‍යාලයෙන් හා එංගලන්තයේ ලන්ඩන් නුවර ළමා සෞඛ්‍ය ආයතනයෙන් වැඩි දුර අධ්‍යාපනය ලබා 2000 වසරේ සිට ප්‍රජා

සෞඛ්‍ය පිළිබඳ විශේෂඥ වෛද්‍යවරියකු ලෙස සේවය කළාය.

නවවැනි පාර්ලිමේන්තුව නියෝජනය කරන විශේෂඥ වෛද්‍ය සුදර්ශනි ප්‍රනාන්දුපුල්ලේ මැතිනිය සිය සැමියා වූ හිටපු ජ්‍යෙෂ්ඨ දේශපාලඥයකු වූ ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ මහතාගේ හදිසි අභාවයෙන් පසු දේශපාලනයට ප්‍රවේශ වූවාය. ඇය අටවැනි පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය කාරක සභා සභාපතිවරියක් ලෙස කටයුතු කළ අතර, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව ආංශික අධීක්ෂණ කාරක සභාවේ සාමාජිකාවකද වූවාය. ළමයින් සඳහා වන පාර්ලිමේන්තු සංසදයේ සභාපතිවරිය, පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ සාමාජික, කාන්තා හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ආංශික අධික්ෂණ කාරක සභාවේ සාමාජිකාවක ද ලෙස ඇය කටයුතු කර ඇත.

## නීතිඥ තලතා අතුකෝරළ

හිටපු අධිකරණ අමාත්‍යවරිය වන නීතිඥ තලතා අතුකෝරළ මහත්මිය එක්සත් ජාතික පක්ෂයේ හිටපු නියෝජ්‍ය නායකයකු වන ගාමිණී අතුකෝරළ මහතාගේ නැගණියයි. සිය සහෝදරයාගේ අභාවයෙන් පසුව ඇය සිය දේශපාලන කටයුතු රත්නපුර දිස්ත්‍රික්කයෙන් ඇරඹුවාය. 2004 වසරේදි ප්‍රථම වරට පාර්ලිමේන්තුවට පිවිසෙන ඇය එක්සත් ජාතික පක්ෂ ලක් වනිතා සංවිධානයේ සභාපතිවරිය හා මැතිවරණ කටයුතු පිළිබඳ ලේකම්, කොළඹ ක්‍රියාදාමයේ සභාපති යන තනතුරු දරා ඇත.

2015 වසරේදි විදේශ රැකියා අමාත්‍යවරිය ලෙසද, 2018 වසරේ අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යවරිය ලෙස ද ඇය කටයුතු කොට ඇති අතර, මෙවර සමගි ජන බලවේගය නියෝජනය කරමින් රත්නපුර දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුවට තේරී පත්ව ඇත. ඇය එම පක්ෂයේ වර්තමාන බලංගොඩ ආසන සංවිධායකවරිය ලෙස ද කටයුතු කරයි.

## රෝහිණී කුමාරි කවිරත්න

වෘත්තියෙන් ගුරුවරියක වූ රෝහිණී කුමාරි කවිරත්න මහත්මිය සිය සැමියා වන සංජීව කවිරත්න මහතාගෙන් පසුව මාතලේ දිස්ත්‍රික්කයෙන් දේශපාලනය ආරම්භ කළාය. අටවැනි පාර්ලිමේන්තුවේ අධ්‍යාපනය පිළිබඳ අනුකාරක සභාවේ සභාපතිවරිය ලෙසද ඇය සුවිශේෂි කාර්යභාරයක් ඉටු කළාය.

## ගීතා සමන්මලි කුමාරසිංහ

පාර්ලිමේන්තු මන්ත්‍රිනී, ගීතා සමන්මලි කුමාරසිංහ මහත්මිය සම්මානනීය සිනමා නිළියක, නිෂ්පාදිකාවක හා ව්‍යවසායිකාවකි. ජීවිතයේ එක් වරක් පමණක් ලැබෙන කලා භූෂණ සම්මානයෙන්ද ඇය පිදුම් ලබා සිටින්නීය. සිරිබෝ අයියා, ලොකු දුව, පාලම යට වැනි විශිෂ්ට නිර්මාණ රැසකට දායකත්වය සැපයීමෙන් අනතුරුව ඇය 2010 වසරේ මුල් වරට දේශපාලනයට පිවිසියේ දකුණු පළාත් සභාව නියෝජනය කරමිනි. අටවැනි පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරියක ලෙස ද කටයුතු කළ ඈ මෙවර ද ගාල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරමින් පාර්ලිමේන්තු වරම් ලබුවාය.

## රාජිකා වික්‍රමසිංහ

පසුගිය සබරගමුව පළාත් සභාවේ හිටපු අමාත්‍ය ශ්‍රී ලාල් වික්‍රමසිංහ මහතාගේ බිරිඳ වන රාජිකා වික්‍රමසිංහ මහත්මිය ප්‍රකට සමාජ සේවිකාවක් වන අතර පොදු ජන පෙරමුණේ කෑගල්ල දිස්ත්‍රික් කාන්තා පෙරමුණේ සක්‍රිය සාමාජිකාවක්ද වෙයි.

## මුදිතා ප්‍රිශාන්ති ද සොයිසා

අටවැනි පාර්ලිමේන්තුව නියෝජනය කරමින් සිටියදි හදිසියේ අභාවයට පත් රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී රංජිත් ද සොයිසා මහතාගේ බිරිඳ වන මුදිතා ප්‍රිශාන්ති ද සොයිසා මහත්මිය ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ රක්වාන ආසන සංවිධායකවරියද වේ.

ස්වේච්ඡා ගුරුවරියක ලෙස කටයුතු කර ඇති ඇය ඇය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ රක්වාන ආසන බල මණ්ඩලයේ සභාපතිවරිය ලෙස ද, සබරගමුව පළාත් සභාවේ කර්මාන්ත සංවර්ධන අධිකාරියේ සභාපතිවරිය ලෙස ද කටයුතු කර ඇත. රංජිත් සොයිසා මහතාගේ අභාවයෙන් පසු දේශපාලනයට පිවිසෙන ඇය රත්නපුර දිස්ත්‍රික්කයෙන් හත්වැනි ස්ථානය ලබාගෙන මෙවර පාර්ලිමේන්තුවට තේරී පත්ව තිබේ.

## කෝකිලා හර්ෂණී ගුණවර්ධන

කෝකිලා හර්ෂණී ගුණවර්ධන මහත්මිය නැසීගිය පළාත් සභා මන්ත්‍රී දේශබන්ධු නාමල් ගුණවර්ධන මහතාගේ නැගණියක වන අතර, සිය සහෝදරයාගේ අභාවයෙන් පසුව ගම්පහ දිස්ත්‍රික්කයෙන් දේශපාලනයට පිවිස මීරිගම ප්‍රාදේශිය සභාවේ විපක්ෂ නායක ධුරයද, බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරියක ලෙසද දශකයකට ආසන්න කාලසීමාවක් කටයුතු කොට ඇත. ඇය වෘත්තියෙන් ගුවන් සේවිකාවකි.

විශේෂඥ වෛද්‍ය සීතා අරඹේපොළ

හිටපු බස්නාහිර පළාත් ආණ්ඩුකාර සීතා අරඹේපොළ මහත්මිය වෘත්තියෙන් උගුර, කන, නාසය පිළිබඳ විශේෂඥ වෛද්‍යවරියකි. ආණ්ඩුකාරවරියක ලෙස පසුගිය සමයේ කසළ ප්‍රතිචක්‍රීකරණය සහ ඩෙංගු නිවාරණ වැඩපිළිවෙලක් දියත් කළ ඇය වඩාත් කතාබහට ලක්වූයේ කොවිඩ් 19 වසංගතය පිටු දැකීමේ කාර්ය සාධක බලකායේ ඉදිරිපෙළ සාමාජිකාවක ලෙසය.

මංජුලා විජේකෝන් දිසානායක

අටවැනි පාර්ලිමේන්තුව නියෝජනය කරමින් සිටිය දී හදිසියේ අභාවයට පත් කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී සාලින්ද දිසානායක මහතාගේ බිරිඳ මංජුලා විජේකෝන් දිසානායක වෘත්තියෙන් ගුරු උපදේශිකාවකි. ඇයද පාර්ලිමේන්තුව නියෝජනය කරන්නේ ප්‍රථම වතාවටය.

ඩයනා ගමගේ

ජාතික ලැයිස්තුවෙන් නවක මන්ත්‍රීවරියක ලෙස පාර්ලිමේන්තුවට පිවිසි ඩයනා ගමගේ මහත්මිය නීතීවේදිනියක් මෙන්ම කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිධාරිනියකි. ඇය 2004 වසරේ පළාත් සභා මැතිවරණයේදී කොළඹ දිස්ත්‍රික් අපේක්ෂිකාවක් ලෙස දේශපාලනයට එක්ව තිබේ.

ආචාර්ය හරිනි අමරසූරිය

ජාතික ජන බලවේගය නියෝජනය කරමින් ආචාර්ය හරිනි අමරසූරිය ද මෙවර ප්‍රථම වරට පාර්ලිමේන්තුව නියෝජනය කරන්නීය. එඩින්බරෝ විශ්වවිද්‍යාලයෙන් ආචාර්ය උපාධිය ලබාගත් ආචාර්ය හරිනි අමරසූරිය ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරියකි. විවෘත විශ්ව විද්‍යාලයට ඇතුළත් වීමට පෙර ඇය ළමා ආරක්ෂක හා මනෝ සමාජීය කටයුතු සම්බන්ධව වසර ගණනාවක අත්දැකීම් ලබා ඇත.

***දුමින්ද වික්‍රමසිංහ***
***මහජන සේවා නිලධාරී***
***සන්නිවේදන දෙපාර්තමේන්තුව***

**පුවත්**

# අභිනව කථානායකවරයාට මහා සංඝරත්නයේ ආශිර්වාදය




නව කථානායකවරයා පත්වූ දිනට පසු දින, පාර්ලිමේන්තුවට වැඩම කළ මහා සංඝරත්නය අභිනව කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතාට ආශිර්වාද කළහ.

නාරාහේන්පිට අභයරාමාධිපති මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමියන් ඇතුළු වැඩම කළ මහා සංඝරත්නය විසින් කථානායකවරයාට ආශිර්වාද සෙත් පිරිත් සජ්ඣායනය කොට ආශිර්වාද කළ අතර, නව ධුරයේ වැඩකටයුතු සාර්ථකව සිදු කිරීමට ඉවහල් වන පරිදි අනුශාසනාවක්ද සිදු කරන ලදි.

විශේෂාංග


# මන්ත්‍රී නාම ලේඛනයේ වගතුග





**පාර්ලිමේන්තුවේ තිබෙන සුවිශේෂ ලේඛන අතර ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට තේරී පත්වන සියලු මන්ත්‍රීවරුන්ගේ නම සහ අත්සන සහිත මන්ත්‍රී නාම ලේඛනය වැදගත්, ඓතිහාසික වටිනාකමකින් යුතු එකකි. පසුගිය දා ඇරඹුණු අභිනව නමවැනි පාර්ලිමේන්තුවේ මුල්ම දිනයේදී ද මෙම ලේඛනය භාවිතයට ගැනිණි.**


ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව නොහොත් රටේ ව්‍යවස්ථාදායකය නියෝජනය කරන්නට සුදුසුකම් ලබන මන්ත්‍රීවරයන් ගණන 225 කි. එයින් 196 ක් මහජන ඡන්දයෙන් තේරී පත් වන අතර සෙසු මන්ත්‍රීවරයන් 29 දෙනා පක්ෂ විසින් ජාතික ලැයිස්තුවෙන් යෝජනා කෙරෙයි.

නවවැනි පාර්ලිමේන්තුවේ පළමු සැසිවාරයේ මංගල රැස්වීමේ දී පාර්ලිමේන්තුව රැස්වෙන දිනයේ ප්‍රථම නිල කටයුත්ත වන්නේ කථානායකවරයා නිතරගයෙන් හෝ රහස් ඡන්දයෙන් තෝරා ගැනීමයි. සෙසු මන්ත්‍රීවරුන් සිය ආගමානුකූලව දිවුරුම හෝ ප්‍රතිඥාව ලබාදෙන්නේ කථානායකවරයාගේ දිවුරුම් දීමෙන් පසුවය. ඉන් පසුව, නියෝජ්‍ය කථානායකවරයා, නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා තෝරා පත් කර ගැනීම සිදුවෙයි.






පාර්ලිමේන්තු මහලේකම්වරයා සාම්ප්‍රදායානුකූලව අභිනව කථානායකවරයා වෙත මන්ත්‍රී නාම ලේඛනය ඉදිරිපත් කර අත්සන් ලබාගැනීම ඊළඟ නිල කටයුත්තයි. ප්‍රථමයෙන්ම, ගරු කථානායකතුමන් සිය නම ලියා අත්සන යෙදීම සිදුකරන අතර, එයින් පසුව අග්‍රාමාත්‍යවරයා ප්‍රමුඛ සෙසු මන්ත්‍රීවරු තම නම ලියා අත්සන් යෙදිය යුතුය.



තවද ස්ථාවර නියෝග 05 (03) වගන්තියට අනුව ඉන් පසුව පාර්ලිමේන්තුව රැස්වෙන කවර හෝ දිනක ඉහත දැක්වූ මුල් අවස්ථාවෙහි, සිය දිවුරුම හෝ ප්‍රතිඥාව ලබා නොදුන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වෙත් නම්, 22 වන ස්ථාවර නියෝගය යටතේ නියම කරනු ලබන අවස්ථාවකදී ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා දැනුවත් කර සභා ගර්භයෙහි, සභා මේසයට පැමිණ දිවුරුම් දිය යුතුය.ඉන් පසුව, මන්ත්‍රී නාම ලේඛනයේ නම ලියා අත්සන යෙදිය යුතුය.

***එස්.ජෙය ප්‍රකාශ්***
***මහජන සේවා සම්බන්ධීකරණ නිලධාරී***
***සන්නිවේදන දෙපාර්තමේන්තුව***

**විශේෂාංග**

# වේත්‍රධාරී ධුරය එහි ඉතිහාසය සහ මෙහෙවර



ගරු කථානායකතුමා සහ පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමාට ඉහළම ගුණාත්මක සේවාවක් කාලානුරූපීව සහ කාර්යක්ෂම අන්දමින් සපයා දී, පාර්ලිමේන්තුවේ සඵලදායී ක්‍රියාකාරීත්වයට පහසුකම් සැපයීම වේත්‍රධාරී දෙපාර්තමේන්තුවේ මෙහෙවරයි.

වේත්‍රධාරියා යනු සභාවේ නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා නීත්‍යනුකූල බලයක් හිමි පිළිගත් නිලධාරියා වන අතර සෙංකෝලය දරන්නා වශයෙන් සභාවේ වරප්‍රසාද ආරක්ෂා කිරීම ඔහුගේ වගකීම ද වේ. වේත්‍රධාරී ධුරයේ ආරම්භය අතීත බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු ඉතිහාසයේ මුල් අවධියේ සනිටුහන් වී ඇත. ක්‍රි.ව. 1279 දී එංගලන්තයේ පළමු එඩ්වඩ් රජු පෞද්ගලික ආරක්ෂකයින් 20කගෙන් සමන්විත වේත්‍රධාරී පිරිසක් පත් කළේය. එය වේත්‍රධාරී ධුරයේ ආරම්භයයි. මීට වසර 80 කට පෙර ප්‍රංශයේ ෆිලිප් ඔගස්ටස් රජු හට පුද්ගලික ආරක්ෂකයින්ගෙන් සමන්විත වේත්‍රධාරී පිරිසක් සිටි බවද වාර්තා වී ඇත.

බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ පළමු වේත්‍රධාරියා නිකලස් මවුඩිට් වන අතර ඔහු ක්‍රිස්තු වර්ෂ 1415 දී එංගලන්තයේ දෙවැනි රිචඩ් රජු විසින් බ්‍රිතාන්‍ය නියෝජිත මණ්ඩලයේ කථානායකවරයා වෙත සේවය සැපයීමට පත්කරන ලදි. වේත්‍රධාරී තනතුර අතීතයේදී “සාර්ජන්ට්”, “සෙංකෝලය දරන්නා”, “මහත්වරුන් හට අසුන් පනවන්නා” (Gentleman Usher) ලෙස ද හැඳින්විණ.

බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු ක්‍රමයේ විකාශයත් සමඟ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ මුලසුන හෙබවූ රජු වෙනුවට රජුගේ නියෝජිතයා වශයෙන් කථානායක මුලසුන දැරීය. එහිදී, කථානායකතුමාට කෙරෙන ගෞරවයක් වශයෙන් සහ රජුගේ බලාධිකාරිය සංකේතවත් කිරීම පිණිස, එතෙක් රජුගේ පෞද්ගලික ආරක්ෂකයා වූ වේත්‍රධාරියා හට සෙංකෝලයේ භාරකරුවීමේ රාජකාරිය පැවරිණි.

1931 ජුලි මස 20 වැනි දින සෙංකෝලයක් පැවතීමේ සහ වේත්‍රධාරීවරයකු පත්කිරීමේ අවශ්‍යතාවය එවකට සිටි කථානායක, ආචාර්ය ෆ්‍රැන්සිස් මොලමුරේ, සුසන්ත ද ෆොන්සේකා, මේජර් ජේ. ඩබ්ලිව්. ඕල්ඩ්ෆීල්ඩ්, ආචාර්ය වී.ආර්. ෂොක්මන්, ඩී.ඩී. ඇතුලත්මුදලි සහ එවකට රාජ්‍ය මන්ත්‍රණ සභාවේ ලේකම් වූ ජී.එන්. ෆාකාර් යන මහත්වරුන් විසින් පළමු වරට සලකා බලන ලදි. වේත්‍රධාරීගේ බලතල සහ කාර්යභාරය, වේත්‍රධාරී කාර්ය මණ්ඩලය සහ ගැලරි වෙත අමුත්තන් ඇතුළත් කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය ද සලකා බලනු ලැබුයේ 1933 මාර්තු මාසයේදී රාජ්‍ය මන්ත්‍රණ සභාව විසිනි.

ගරු කථානායකතුමාගේ අනුමැතිය සහිතව පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් වේත්‍රධාරී පත් කරනු ලබන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 65 (3) වගන්තිය අනුවයි. එම් ඉස්මයිල්, එම්. බී.ඊ. නාමධාරී ප්‍රථම වේත්‍රධාරීවරයා විය. ඔහු වර්ෂ 1947 සිට 1961 දක්වා එම ධුරය හොබවන ලදී. ඉන්පසු ජේ.ආර්.සිල්වා මහතා (1961 සිට 1970), රොනී අබේසිංහ මහතා (1970 සිට 1996), විජය පල්ලියගුරුගේ මහතා (1996 සිට 2006) හා අනිල් පරාක්‍රම සමරසේකර මහතා (2006 සිට 2018) වේත්‍රධාරී ධුරයේ වගකීම් දැරූහ.

පාර්ලිමේන්තු වරප්‍රසාදවල ආරක්ෂකයා වන ගරු කථානායකතුමා විසින් නිකුත් කරනු ලබන නියෝග ක්‍රියාත්මක කිරීමට නීතියෙන් බලය දී ඇති ප්‍රධාන බලාත්මක කරන්නා වන වේත්‍රධාරියා සෙංකෝලයේ භාරකාරීත්වය හොබවන අතර සභාව තුළ දී මූලාසනය විසින් දෙනු ලබන නියෝග ක්‍රියාත්මක කරනු ලබන නිලධාරියා වේ.

ස්ථාවර නියෝග 77 - 80 අනුව, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු මූලාසනයේ බලයට අවනත නොවීම හෝ නොසලකා සිටීම හේතුකොටගෙන හෝ සිතාමතා සභාවේ කටයුතුවලට බාධා කරමින් ක්‍රියා කිරීම හෝ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග උල්ලංඝනය කිරීම නිසා අදාළ මන්ත්‍රීවරයා සභා ගර්භයෙන් ඉවත් කිරීමට හෝ එම මන්ත්‍රීවරයාගේ පාර්ලිමේන්තු සේවය තාවකාලිකව අත්හිටුවීමට මූලාසනය විසින් දෙනු ලබන නියෝගයක් ක්‍රියාත්මක කිරීමට හෝ වේත්‍රධාරීයාට බලය ඇත. යම් සාක්ෂිකරුවකු, චූදිතයකු හෝ වෙනත් යම් පුද්ගලයකු සභාවේ සීමාව වෙත කැඳවනු ලබන විටෙක එවන් තැනැත්තන් කැටුව යාමේ බලය ද වේත්‍රධාරී සතුය. රැස්වීම් දිනයක පාර්ලිමේන්තු පරිශ්‍රය තුළ අවිනීත හැසිරීමක් හෝ නීති විරෝධී අයුරින් ගොඩනැගිල්ල තුළට ඇතුළු වීම, බාධා කිරීම් සිදු කිරීම හෝ එවැනි යමක්

කිරීමට අන් අයට සහාය සැපයීම නිසා කථානායකවරයා විසින් ලබා දෙන ලිඛිත හෝ වාචික නියෝගයක් මත ඕනෑම පුද්ගලයෙකු වරෙන්තුවකින් තොරව අත්අඩංගුවට ගැනීමටත්, පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ 21 සහ 29 වන වගන්ති යටතේ එම පුද්ගලයාට යම් දඬුවමක් සම්බන්ධව පාර්ලිමේන්තුව විසින් තීරණය කරන තෙක් එම පුද්ගලයා අත්අඩංගුවේ තබාගැනීමේ බලය වේත්‍රධාරියා සතුය. අත්අඩංගුවට ගත් එවන් පුද්ගලයින් භාරදීම ද ඇතුළුව කථානායකතුමාගේ නියෝග ප්‍රකාරව අදාළ කාර්ය පටිපාටිය වේත්‍රධාරී විසින් සිදු කෙරේ.

අනුචිත ඇඳුමින් සැරසී පාර්ලිමේන්තු සභා ගර්භයට ඇතුළුවන ඕනෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගෙන් නොපමාව සභා ගර්භයෙන් ඉවත්වන ලෙස ඉල්ලා සිටීමට වේත්‍රධාරීවරයාට හැකිය. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විසින් සභාව තුළ යම් කරුණක් මතු කළ විට ඒ පිළිබඳව නොපමාව සොයා බලන මෙන් කථානායක විසින් වේත්‍රධාරීවරයාට නියම කරනු ලබන අතර, එම කරුණ සම්බන්ධයෙන් අපක්ෂපාතී වාර්තාවක් ලබා දීමට වේත්‍රධාරී බැඳී සිටියි.

තම රාජකාරිය ඉටුකිරීමේදී වේත්‍රධාරී විසින් සභා ගර්භය තුළ ප්‍රධාන දොරටුව අසල පිහිටා ඇති විශේෂ අසුනක් හොබවනු ලැබේ. තම උත්සවීය ඇඳුමේ කොටසක් වශයෙන් සභා ගර්භය තුළට ආයුධයක් (කඩුව) රැගෙන යාමේ අවසරය ඇති එකම පුද්ගයා වේත්‍රධාරියා වේ. පාර්ලිමේන්තු රැස්වන සාමාන්‍ය දිනවලදී වේත්‍රධාරී සුදු පැහැති නිල ඇඳුමකින් සැරසී සිටින අතර උත්සවාකාර අවස්ථාවලදී විශේෂයෙන් නිර්මාණය කළ කළු පැහැති උත්සවීය නිල ඇඳුමකින් සැරසේ. වේත්‍රධාරී තනතුර ලුතිනල් ජෙනරාල්වරයෙකුගේ තනතුරට සමාන වේ. වේත්‍රධාරීගේ කාර්යභාරයන්ට උත්සවීය, සභා ගර්භය, ආරක්ෂාව, අමුත්තන් පරිපාලනය, ඉඩ පහසුකම් සහ දෙපාර්තමේන්තු කටයුතු ද ඇතුළත් වේ.

වේත්‍රධාරියා පොදු රාජ්‍ය මණ්ඩලයීය වේත්‍රධාරීවරුන්ගේ සංගමයේ සාමාජිකයකු වන අතර පාර්ලිමේන්තු කළමනාකරණයේ නව ප්‍රවණතා පිළිබඳ දැනුවත්වීම සඳහා එම සංගමයේ රැස්වීම් සඳහා සහභාගි වෙයි. වේත්‍රධාරී පත් කිරීම සහ විශ්‍රාම යාම සම්ප්‍රදායක් වශයෙන් පාර්ලිමේන්තුවේ නිවේදනය කරනු ලැබේ. එසේම, වේත්‍රධාරියකු විශ්‍රාම යන අවස්ථාවේදී එම වේත්‍රධාරියාගේ සේවය සම්බන්ධයෙන් සිදු කරනු ලබන අගය කිරීමේ යෝජනාවක් සම්මත කර ගැනීමට පාර්ලිමේන්තුවේ දිනයක් වෙන් කරනු ලැබේ.



*නරේන්ද්‍ර ප්‍රනාන්දු*
*වේත්‍රධාරී*
*ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව*

**පුවත්**

# පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව පත් කෙරේ



පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 114 හි විධිවිධාන ප්‍රකාරව, නවවැනි පාර්ලිමේන්තුවේ පළමු සභාවාරයේ සේවය පාර්ලිමේන්තු සඳහා තේරීම් කාරක සභාව පත් කර තිබේ.

ගරු කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතාගේ සභාපතිත්වයෙන් සහ දේශපාලන පක්ෂ නායකයන් සහ ඔවුන්ගේ නියෝජිතයන් ද ඇතුළත්ව පාර්ලිමේන්තුව විසින් නම් කරනු ලබන සාමාජික මන්ත්‍රීවරයන් 12 දෙනෙකුගෙන් තේරීම් කාරක සභාව සමන්විතය.

අමාත්‍යවරු වන නිමල් සිරිපාල ද සිල්වා, දිනේෂ් ගුණවර්ධන, ජෝන්ස්ටන් ප්‍රනාන්දු, ඩග්ලස් දේවානන්ද, ඩලස් අලහප්පෙරුම, විමල් වීරවංශ හා ප්‍රසන්න රණතුංග යන මහත්වරු සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු වන ලක්ෂ්මන් කිරිඇල්ල, ගයන්ත කරුණාතිලක, රවුෆ් හකීම්, විජිත හේරත් සහ සෙල්වම් අඩෛයිකලනාදන් යන මහත්වරු සහ කථානායකවරයාට අමතරව තේරීම් කාරක සභාවට ඇතුළත් වෙති.

**පුවත්**

# ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ හිටපු සභාපති සහ හිටපු කථානායක කරු ජයසූරිය මහතාට කෘතවේදීත්වය පළවේ



හිටපු කථානායක සහ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සභාවේ හිටපු සභාපති කරු ජයසූරිය මහතා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සභාව මෙහෙයවූ ආකාරය පිළිබඳව ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා ඇතුළු එම සභාවේ සමාජිකයන්ගේ ඇගයීමට ලක්විය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සියලු රැස්වීම් සුහද වාතාවරණයක් තුළ පැවැත්වීමටත් සියලු සාමාජිකයන්ගේ අදහස් වලට ඉඩ ප්‍රස්තා සලසා දීමත් පිළිබඳව ගරු අග්‍රාමාත්‍යවරයා සිය කෘතවේදීත්වය පළ කර සිටියේය. හිටපු කථානායකවරයා සම්බන්ධයෙන් ගරු අගමැතිවරයා පළ කළ අදහස් සමඟ තමන් ද එකඟ වන බව හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී මහින්ද සමරසිංහ මහතා සඳහන් කළේය.

ඔවුන් මේ බව පැවසුයේ හිටපු කථානායක කරු ජයසූරිය මහතා සභාපතිත්වය දැරූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අවසාන රැස්වීම පසුගිය අගෝස්තු 03 වැනිදා පස්වරුවේ කථානායක නිල නිවසේදී පැවති අවස්ථාවේදීය.

මෙහිදී තමන් විසින් සභාපතීත්වය දරන අවසාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභා රැස්වීම මෙය බව සඳහන් කළ සභාපතිවරයා මෙතෙක් එහි කටයුතු පවත්වා ගෙන යාම සඳහා ගරු අගමැතිවරයා ඇතුළු සාමාජිකයන්ගෙන් ලැබුණු සහයෝගය පිළිබදව සිය ස්තූතිය පළ කළේය. එමෙන්ම ව්‍යවස්ථා සභාව විසින් සියලු තීරණ ගනු ලැබුවේ සියලු සාමාජිකයන් ඉදිරිපත් කළ කරුණු සාකච්ඡාවට ලක්කරමින් සියලු දෙනාගේම එකඟත්වය ඇතිව බවද කරු ජයසූරිය මහතා සඳහන් කළේය.

ඒ අතරම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සියලු රැස්වීම් ඉතා කාර්යක්ෂමව සහ විධිමත්ව පැවැත්වීමට පාර්ලිමේන්තුවේ මහ ලේකම් ධම්මික දසනායක මහතා සහ කාර්ය මණ්ඩලයෙන් ලැබුණු සහයෝගය පිළිබඳවද සභාපතිවරයා සිය ස්තූතිය පළ කළේය. එමෙන්ම සභාපතිවරයා ස්වාධීන කොමිෂන් සභාවල සභාපතිවරුන්ට ද සිය කෘතවේදිත්වය පළ කළේය.

විශේෂාංග

# මහජන ඡන්දයෙන් නවවන පාර්ලිමේන්තුව තරුණ වෙයි

පාර්ලිමේන්තුව රටේ ජනතාව වෙනුවෙන් නීති සම්පාදනය කරන ප්‍රධානතම කේන්ද්‍රස්ථානයයි. එසේ අනාගතයට බලපවත්නා පරිදි තීරණ ගැනීමේදී එවන් ආයතනයක තරුණ නියෝජනයක් දක්නට ලැබීම සෞඛ්‍ය සම්පන්න ප්‍රජාතන්ත්‍රවාදී අවකාශය පුළුල්කරණයට ඉවහල් වෙයි. ඒ සඳහා වන සාධනීය බලාපොරොත්තුවක් මෙවර පාර්ලිමේන්තුව මඟින් මල්ඵල ගැන්වී තිබේ.

ලබන 20 වැනිදා ඇරඹෙන නවවන පාර්ලිමේන්තුවට වයස අවු. 25-40 තෙක් මන්ත්‍රීවරු 26 ක් මහජන ඡන්දයෙන් තේරී පත්ව සිටින අතර, එයින් තරුණ මන්ත්‍රීවරුන් පස්දෙනෙක් වයස අවු. 25-30 දක්වා වයස් කාණ්ඩයට අයත්ව සිටීම අතිශය ධනාත්මක තත්ත්වයක් ලෙස සැලකිය හැකිය. වෘත්තීමය වශයෙන් විවිධ අංශ නියෝජනය කරන අභිනව පාර්ලිමේන්තුවේ තරුණ මන්ත්‍රීවරුන්ගේ නියෝජනය ප්‍රතිශතාත්මකව ගත් කල 11% ක් වේ. මීට අමතරව, අවු.41-50 දක්වා වයස් කාණ්ඩයෙන් මන්ත්‍රීවරු 67 ක් මෙවර මහජන ඡන්දයෙන් තේරී පත්ව සිටිති.



මෙවර මහජන ඡන්දයෙන් තේරී පත්වූ ළාබාලතම මන්ත්‍රීවරයා වන්නේ වතු නිවාස සහ ප්‍රජා යටිතල පහසුකම් ගරු රාජ්‍ය අමාත්‍ය ජීවන් කුමාරවේල් තොණ්ඩමන් මහතා ය. සිය පියා වූ හිටපු අමාත්‍ය ආරුමුගම් තොණ්ඩමන් මහතාගේ හදිසි අභාවයෙන් පසු ලංකා කම්කරු කොංග්‍රසයේ මහලේකම් ධුරයට පත්වූ හෙතෙම නීතිවේදියෙකි. 1994 නොවැම්බර් 09 දින උපන් ඔහු මෙවර අමාත්‍ය මණ්ඩලයේ සිටින ළාබාලතම අමාත්‍යවරයාද වේ. මීට පෙර පාර්ලිමේන්තු ඉතිහාසයෙහි නියෝජ්‍ය අමාත්‍ය ධුරයක් ලත් ළාබාලතම මන්ත්‍රීවරයාගේ වාර්තාවට හිමිකම් කියනුයේ දුමින්ද දිසානායක මහතා වන අතර එම ධුරය ලබන විට ඔහුගේ වයස ද අවු.25ක් විණි.







අවු.25-30 කාණ්ඩයේ සිටින පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සිවු දෙනා අතරින් එක් අයෙක් මඩකලපුව දිස්ත්‍රික්කය නියෝජනය කරයි. ඔහු මෙවර පළමු වරට පාර්ලිමේන්තුවට පැමිණෙන ඉලංකෙයි තමිල් අරසු කච්චි පක්ෂයේ සානක්‍ය රාහුල් (අවු.30) යි. මාතර දිස්ත්‍රික්කය නියෝජනය කරන තිස් වියැති නිපුණ රණවක මහතා සහ මොණරාගල දිස්ත්‍රික්කය නියෝජනය කරමින් පළමු වරට පාර්ලිමේන්තුවට තේරී පත්ව සිටින වෛද්‍ය ගයාෂාන් නවනන්ද යන මහත්වරු අනෙක් තරුණ මන්ත්‍රීවරු දෙපළ වෙති. මේ කාණ්ඩයට අයත් සියලු තරුණ මන්ත්‍රීවරයන් උපාධිධරයන් වීමද විශේෂත්වයකි.

මහජන ඡන්දයෙන් තේරී පත්වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් අතර අවුරුදු 31-40 දක්වා වයස් කාණ්ඩය නියෝජනය කරන්නන් ගණන 21 ක් වන අතර, එයින් 09ක් ප්‍රථම වරට පාර්ලිමේන්තුව නියෝජනය කරන නවක මන්ත්‍රීවරු වෙති. ඒ වයස් කාණ්ඩයේ සිටින, වාර කිහිපයක් පාර්ලිමේන්තුව නියෝජනය කර, මෙවර ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නියෝජනය කරන නාමල් රාජපක්ෂ මන්ත්‍රීවරයා මෙරට පත්වූ ළාබාලතම තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යවරයාද වෙයි.



අවු.41-50 වයස් කාණ්ඩයෙන් මහජන ඡන්දයෙන් නවවැනි පාර්ලිමේන්තුවට තේරී පත්ව සිටින මන්ත්‍රීවරයන් සංඛ්‍යාව 67ක් වන අතර ප්‍රථම වරට පාර්ලිමේන්තුවට පැමිණෙන කාන්තා මන්ත්‍රීවරියන් දෙපළක් වන ගම්පහ නියෝජනය කරන කෝකිලා හර්ෂණී ගුණවර්ධන මහත්මිය සහ කෑගල්ල නියෝජනය කරන රාජිකා වික්‍රමසිංහ මහත්මිය ද සිටිනුයේ මෙම කාණ්ඩය ඇතුළතය.

වයස අවු.51-60 කාණ්ඩය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සංඛ්‍යාව 54 ක් වන අතර එය ප්‍රතිශතයක් ලෙස 27% ක අගයක් ගනී. සමඟි ජනබලවේගය පක්ෂයෙන් යළිත් පාර්ලිමේන්තු වරම් ලද, හිටපු විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා ද, ජාතික ජනබලවේගය නියෝජනය කරමින් තේරී පත් වූ පක්ෂ නායක අනුර කුමාර දිසානායක, දයාසිරි ජයසේකර, මහින්ද අමරවීර, පාඨලී චම්පික රණවක, පලනි දිගම්බරන්, රවුෆ් හකීම් සහ මනෝ ගනේෂන් යන මහත්වරු මෙම කාණ්ඩයට අයත් විවිධ දේශපාලන පක්ෂ වල ප්‍රමුඛ පෙළේ තනතුරු දරන අතර දීර්ඝකාලීන පාර්ලිමේන්තු පරිචයක් සහිත මන්ත්‍රීවරු ද වෙති.

අභිනව පාර්ලිමේන්තුවේ අවු.61-70 වයස් කාණ්ඩය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් ගණන 37 කි. 69 වියැති හිටපු ජනපති මෛත්‍රීපාල සිරිසේන මහතා ද මෙම කාණ්ඩය නියෝජනය කරන දීර්ඝකාලීන අත්දැකීම්වලින් හෙබි පරිණත දේශපාලකයෙකු ලෙස හඳුන්වා දිය හැකිය.

අවු.71-80 තෙක් වයස් කණ්ඩායම නියෝජනය කරන පරිණත මන්ත්‍රීවරු 09 ක් මෙරට පාර්ලිමේන්තුවේ කටයුතු කරති. ඔවුහු අතර වත්මන් අගමැති හා මුදල්, බුද්ධශාසන, ආගමික, සංස්කෘතික කටයුතු, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා ද, වාරිමාර්ග අමාත්‍ය සහ අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු, ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍ය චමල් රාජපක්ෂ මහතා ද සිටිති. අවු.81-90 දක්වා වයස් කාණ්ඩයේ සිටින පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් අතර යාපනය නියෝජනය කරන හිටපු උතුරු පළාත් ආණ්ඩුකාර ධුරය දැරූ සී.වීගවිග්නේෂ්වරන් මහතා ද, රත්නපුර දිස්ත්‍රික්කයේ අමාත්‍ය වාසුදේව නානායක්කාර මහතා සහ ත්‍රිකුණාමලය නියෝජනය කරන ඉලංකෙයි තමිල් අරසු කච්චි පක්ෂයේ නායකත්වය දරන ආර්. සම්පන්දන් මන්ත්‍රීවරයා ද වෙති.

*රශ්මියා නූටාන්*
***මහජන සේවා නිලධාරිනී, සන්නිවේදන දෙපාර්තමේන්තුව***

විශේෂාංග

# දේශපාලනයේදී කාන්තාවන්ට සමාන අවස්ථා ලබාදීම සඳහා නිසි වැඩපිළිවෙලක් අවශ්‍යයි



කොළඹ විශ්වවිද්‍යාලයේ උපකුලපති, විශේෂඥ වෛද්‍ය
මහාචාර්ය චන්ද්‍රිකා එන් විජේරත්න මිය

"ශ්‍රී ලංකාවේ ළමා හා මාතෘ මරණ අනුපාතය සලකා බැලීමේ දී ලෝකය තුළ අපිට සතුටු විය හැකියි"

**මෙරට කාන්තාව අධ්‍යාපනික වශයෙන් තවදුරටත්, ශක්තිමත් කිරීම සඳහා ඔබතුමිය ඉදිරිපත් කරන යෝජනා කවරේද ?**

අධ්‍යාපනය කියන්නේ උපාධියක් ලබා ගැනීම පමණක් නොවෙයි.ජීවිතය ගැන ඉගෙනීමටත් අධ්‍යාපනයක්. කාන්තාවට අද හොඳ සමාජීය පිළිගැනීමක් තියෙනවා. බුදු දහම මූලික කර ගත් අපේ රටේ සමාජයේ ගෙදර බුදුන් අම්මා යන සංකල්පය තුළ සිටයි ජීවත් වෙන්නේ. රැකියා වෙළඳ පොළට ගැලපෙන පරිදි අධ්‍යාපන රටාව වෙනස් වී තිබෙනවා. පවුලකට නායකත්වය දෙන්නේ අපේ අම්මලා. ගෙදර වැඩ කටයුතු සියල්ල මෙහෙය වන්නේ ඇයගේ සුරතින්. නායකත්වය කියන්නේ අධ්‍යාපනය පමණක් නොවන බව අද සනාථ වී තිබෙනවා. රටට ආදරය කරන පුද්ගලයෙක් බිහි වන්නේ සමාජීය අධ්‍යාපනයෙන්. ලංකාවේ ජනප්‍රිය පාසල් වල තිබෙන පහසුකම් ඈත ගම්බද පාසල්වල තියෙනවද, මෙය පැහැදිලිවම අවධානය යොමුකළ යුතු කාරණයක්. මෙරට කාන්තාව අධ්‍යාපනික වශයෙන් තවදුරටත්, ශක්තිමත් කිරීම සඳහා අනිවාර්යයෙන්ම ග්‍රාමීය පාසල් තුල විද්‍යාව, ගණිතය හා තාක්ෂණික විෂයන් පිළිබඳ තව දුරටත් අවධානය යොමු කරන්න ඕනි. සියලු දේ හිමි විය යුත්තේ පුතාට යන සංකල්පයෙන් අපේ අම්මලා මිදිලා කටයුතු කරන්න ඕනි. අපි කොහොම කථා කළත් ගෙදරක තවමත් විශේෂත්වයක් දක්වන්නේ පුතාට, මේ පාර්ශව දෙකටම සමාන අවස්ථා හිමි වෙන්න ඕන.

**කාන්තාවගේ සෞඛ්‍ය සම්පන්න භාවය වෙනුවෙන්, ඔවුන් ක්‍රියාත්මක කළ යුතු ක්‍රියාමාර්ග කවරේද ? ග්‍රාමීය කාන්තාවන්ගේ සෞඛ්‍ය සම්පන්න භාවය ඇති කිරීම වෙනුවෙන් ගතයුතු විශේෂ ක්‍රියාමාර්ග කවරේද ?**

ශ්‍රී ලංකාවේ ළමා හා මාතෘ මරණ අනුපාතය ලෝකයේ අනෙකුත් රටවල ළමා හා මාතෘ මරණ අනුපාත දත්ත හා සසඳන විට අපිට සතුටු විය හැකියි. විශේෂයෙන් අපේ රටේ ප්‍රාථමික සෞඛ්‍යය ඉතා හොඳ මට්ටමක තියෙනවා. ප්‍රජාව ප්‍රාථමික සෞඛ්‍ය පිළිබඳව දැනුවත්. ප්‍රජාව සමඟ සමීපව කටයුතු කළ අයෙක් ලෙස එය මා හොදට දන්නවා. මෙරට යුද්ධය දරුණුවටම තිබුන කාලයේ නන්දිකඩාල් කලපුව හරහා ආරක්ෂක අංශ වෙත පැමිණි මවුවරුන් අරන් ආවේ ළමයින්ගේ සෞඛ්‍ය දත්ත පොත් හා ළඟ තිබූ රත්තරං පමණයි. කාන්තාවට ආහාර, ඖෂධ වැනි සියලු දේ ලබා දිය යුතුයි. කාන්තාවගේ සෞඛ්‍යය සම්පන්නභාවය වෙනුවෙන් ක්‍රියා කළ යුත්තේ කාන්තාව පමණක් නෙවේ. පුරුෂ පාර්ශවයට ඊට විශාල වගකීමක් තියෙනවා. ඇතැම් ආගමික ඉගැන්වීම් තුළ කාන්තාවට සීමාවන් පනවා තිබෙනවා. ඔවුන්ට ක්‍රීඩා කිරීම වැනි දේ සීමා කර තිබෙනවා. ඒක විශාල ගැටලුවක්.

**වර්තමාන සමාජය තුළ කාන්තාව නායකයෙකු ලෙස ඉදිරියට ගමන් කළ යුත්තේ ඇයි ?**

පුරුෂ පාර්ශවය මෙන්ම කාන්තාව අද විවිධ ක්ෂේත්‍රයන්ගෙන් ඉදිරියට ගිහින් තිබෙනවා. හෙදියන්, ගුරුවරියන් යන පාර්ශව දෙකම ගත්තොත් ඔවුන්ද හොඳ නායකයන්,ග්‍රාමීය සංවර්ධනය සඳහා නායකත්වය දෙන කාන්තාවන් විශාල පිරිසක් අපේ රටේ ඉන්නවා. සමාජයේ කාන්තාවට හිමි විය තැන ඇයට ලැබිය යුතුයි. කාන්තාවන් වෙනුවෙන් අවස්ථා සම්පාදනය කළ යුතුයි. විදෙස්ගත කාන්තාව විශාල පීඩනයකට අද මුහුණ දී තිබෙනවා. හාම්පුතුන්ගෙන් දූෂණය වී දුක් විඳින කාන්තාවන් වෙනුවෙන් පෙනී සිටිය යුතුයි. විශේෂයෙන් මෙරට කාන්තාව ග්‍රාමීය වශයෙන් විවිධ සමිති සමාගම් පිහිටුවා ගෙන කටයුතු කරනවා. මව්වරුන්ගේ මූලිකත්වයෙන් පිහිටුවා ඇති මහිලා සමිති, සංවර්ධන සමිති, ණය දෙන සමිති ආදී වශයෙන් විවිධ ක්‍රමවේදවල පිහිටුවා ගෙන විවිධ සාධනීය කාර්යයන්ගේ ඇය නිරත වෙනවා. එය සාධනීය ලක්ෂණයක්. ඒ

වගේම වතුකරයේ කාන්තාව විශාල ලෙස පීඩනයට ලක්ව තිබෙනවා. ශාරීරික වශයෙන් මෙන්ම, මානසික වශයෙන්ද ඇතම්විට ලිංගික වශයෙන්ද ඇය පීඩිත තත්ත්වයට පත්ව තිබෙනවා. ඔවුන් වෙනුවෙන්ද සාර්ථක වැඩපිළිවෙළක් අවශ්‍යයි.

**ලොව දියුණු රටවල් හා සැසඳීමේදී මෙරට කාන්තාවගේ දේශපාලන සහභාගීත්වය අවම මට්ටමක පවතී ඔබතුමියගේ මතය අනුව දේශපාලන වශයෙන් මෙරට කාන්තාව මුහුණ දෙන අභියෝග මොනවාද ?**

බොහෝ විට මෙරට කාන්තාව දේශපාලනයට පිවිසෙන්නේ තමන්ගේ පියාගේ හෝ ස්වාමි පුරුෂයාගේ අඩිපාරේ යමින්. එවැනි දේශපාලන පවුල් පසුබිමක් නොමැති කාන්තාවට දේශපාලනයට පිවිසිය නොහැකියි. කාන්තාව දේශපාලනයට පිවිසීමේ අවස්ථා සම්පාදනය ගැන ගැටලු රැසක් මතුව තිබෙනවා. පිරිමින් සමඟ දේශපාලනයේදී සමාන්තරව කටයුතු කිරීමට කාන්තාවන්ට අවස්ථාව ලබා දිය යුතුයි. මෙම තත්ත්වය සඳහා ජනමාධ්‍යයේ ක්‍රියාකාරීත්වයද යම් ප්‍රබල මට්ටමකට බලපෑම් කර තිබෙනවා. '

**මෙරට කාන්තාවගේ දේශපාලන සහභාගීත්වය වර්ධනය කිරීම සඳහා ඔබතුමිය ඉදිරිපත් කරන යෝජනා කවරේද ?**

දේශපාලනයේදී කාන්තාවන්ට සමාන අවස්ථා ලබාදීම සඳහා නිසි වැඩපිළිවෙලක් අවශ්‍යයි. ලොව අන් රටවල පවතින තත්ත්වයන් පිළිබඳව අධ්‍යයනය කිරීම ඉතාම වැදගත්, ගැලපෙන සුදුසු ක්‍රමවේදයක් යටතේ, පවතින මෙම අසමානතාවය සමතයකට පත් කිරීමට වැඩපිළිවෙළක් අවශ්‍ය වෙනවා. ප්‍රාදේශීය මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා මෙරට කාන්තාවගේ දේශපාලන සහභාගීත්වය වර්ධනය විය යුතු බව මා තරයේ විශ්වාස කරනවා.

**කාන්තා හිංසනය අවම කිරීම සඳහා නව රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක විය යුතුද, ඔව් නම් එලෙස ක්‍රියාත්මක කළ යුතු නව රාජ්‍ය ප්‍රතිපත්ති මොනවාද ?**

මෙරට කාන්තාව දැඩි පීඩාවට ලක් වන්නේ තමාගේ නිවස තුළදීමයි. පොලිස් ළමා හා කාන්තා කාර්යංශයේ දත්ත සලකා බැලීමේදී මෙම තත්ත්වය ඉතා පැහැදිලි වෙනවා. ගර්භණී කාලය තුළදී මෙම තත්ත්වය ඉතා දරුණු අතට හැරෙනවා.

කාන්තා හිංසනයන්ට එරෙහිව පවතින නීතිය දැඩිව ක්‍රියාත්මක විය යුතුයි. මෙය ඉතා වැදගත්. භයානකම කාරණය තමයි තමාට ලක්වන හිංසනය ගැන එළිපිට කතා කිරීමට කාන්තාව දක්වන භය හා අකමැත්ත. එලෙස කතා කිරීම තමාට හා පවුලට පසුකාලීනව අයහපත් ලෙස බලපාන බවට ඔවුන් විශ්වාස කරනවා. ඒ වගේම අද වන විට මාධ්‍ය විකෘතියක් විදාශ ලෙස දක්නට ලැබෙනවා. ඒ මඟින් සමාජගත කරන්නේ යහපත් මතවාදයන් නෙවේ. රටේ තවමත් නිසි කාන්තා ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වන්නේ නෑ. මෙම බරපතළ කාරණය ගැන අදාළ අංශ නිසි අවධානය යොමු කරන්න ඕන. අනෙක් අතට රට තුළ ආචාරධර්මීය ප්‍රවේශයක් අවශ්‍ය වෙනවා. නව ප්‍රතිපත්ති සම්පාදනය වගේම කාන්තා හිංසනයට එරෙහිව පවතින නීතිය දැඩිව ක්‍රියාත්මක කළ යුතුයි. කාන්තාව තමා මුහුණ දෙන හිංසනයන් ගැන පෙනී සිටිය යුතුයි. තොරතුරු සැඟවීමෙන් මෙම තත්ත්වය පාලනය කළ නොහැකියි. ඇයට සහයෝගය දීමට සමාජය ඉදිරිපත් වීම ඉතා වැදගත්.

**සමස්තයක් ලෙස මෙරට කාන්තාවන් සඳහා ඔබතුමිය ලබා දෙන පණිවිඩය කුමක්ද?**

කාන්තාව අද කලාත්මක දේ සඳහා පමණක් නොවේ. තාක්ෂණික වශයෙනුත් ගොඩාක් ඉදිරියට පැමිණ තිබෙනවා. ආර්ථික, සාමාජීය මෙන්ම සංස්කෘතික වශයෙන් තමා මුහුණ දෙන මෙම අභියෝගාත්මක කාරණයන් පිළිබඳව විශේෂ අවධානයක් යොමු කර කාන්තාව කටයුතු කළ යුතුයි. ඕනෑම අභියෝග යකට සාර්ථකව මුහුණදීම සඳහා අවශ්‍ය ශක්තිය ඔබ සතුව තිබෙනවා. අවශ්‍ය වන්නේ එම අභියෝගාත්මක තත්ත්වයන් ජය ගැනීම සඳහා ඔබ පෙනී සිටීම පමණයි. දුප්පත් මානසිකත්වයක නොසිට ධනාත්මකව සිතීමට අප කටයුතු කළ යුතුයි. එමෙන්ම අධ්‍යාපනයෙන් පෝෂිත වන වර්තමාන කාන්තාවන් වන ඔබ විවිධ ක්ෂේත්‍රයන්හි නායකත්ව පදවි, පරිපාලන වගකීම් දැරීමට පසුබට නොවීමට කටයුතු කළ යුතුයි.

*සාකච්ඡා කළේ - එදිරිවීර ගුණසේකර*
*මාධ්‍ය නිලධාරී*
*සන්නිවේදන දෙපාර්තමේන්තුව*

# ඡායා ගැලරිය

## නවවැනි පාර්ලිමේන්තුවේ පළමු සභාවාරය උත්සවාකාරයෙන් විවෘත කෙරේ





## ගරු කථානායකතුමා පළමුවරට සභාව අමතයි





## පාර්ලිමේන්තු සැසියෙන් පසුව පැවැත්වූ තේ පැන් සංග්‍රහය අතර සුහද පිළිසඳරක...







සන්නිවේදන දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ,
ශ්‍රී ලංකාව

දුරකථනය : +94 11 2777100
ෆැක්ස් : +94 11 2777227

Parliament of Sri Lanka | @ParliamentLK | @slparliament | Parliament of Sri Lanka